# සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය - රුවන්වැල්ල

# අයදුම්පත් කැඳවීම

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන් සහ සමිති බල ප්‍රදේශයේ ප්‍රමුඛතා අනුපිළිවෙලට කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18 ත් - 45 ත් අතර (සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ) අයදුම්කරුවෙන්ගෙන් අයදුම්පත් 2026.07.06 දින දක්වා මා විසින් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | : | **ලිපිකරු (මෙහෙයුම් II ශ්‍රේණිය)** |
| **වැටුප් ක්‍රමය** | : | 32,500 - 10 X 180.00 - 10 X 190.00 = 36,200.00 |
| **පන්තිය** | : | III |
| **පුරප්පාඩු සංඛ්‍යාව** | : | 02 |

**සුදුසුකම් :**

I. අ.පො.ස. (උ.පෙ) සාමාර්ථය ලබා තිබීම

හෝ

II. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා තිබීම

හෝ

III. සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක වසර 03 ක පළපුරුද්ද තිබීම

හෝ

IV. ගණිතය, සිංහල /දෙමළ ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙ.) එකවර සමත්වීම සහ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම. (ඉංග්‍රීසි සමත් වීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ)

හෝ

V. කාර්යාල කාර්ය සහායක තනතුරක වසර 05 ක් සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**සැ. යු :**

සමිති අභ්‍යන්තර සේවකයන් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමග අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නේ නම් එම සමිතියේ මෑතකදී ලබාගත් සේවා සහතිකයේ පිටපතක් සහ ඉල්ලුම් කරන තනතුරට ඔබව තෝරාගත හොත් දැනට සේවය කරනු ලබන සමිතියෙන් නිදහස් කරන බවට සමිතියෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත සමිතියේ සභාපතිතුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, චරිත සහතික දෙකක්, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතිකය, සේවා සහතික හා වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

**"ගරු සභාපති, සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල."**

**ගරු සභාපති,**
**සී/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය, රුවන්වැල්ල.**
**2026.06.22**
**036-2266392 / 0362267345**